**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණ බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

**(ආ)** අමාත්‍යාංශයේ ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිදන්ගත වකුගඩු රෝග වැලැක්වීමේ හා පර්යේෂණ ලේකම් කාර්යාලයට ලබා දී තිබූ රජයේ නිවාසයේ 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම් ශේෂය රු. 2,580,000 ක් වුවද, 2018 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ශේෂයක් දක්වා නොතිබුණු අතර වර්ෂය තුල කිසිදු අය කිරීමක් ද සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් හිඟහිටි ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | හිඟහිටි ආදායමෙන් ඉවත් කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වීම. | මෙම නිවස වෙන්කල දින සිටම කුලී මුදල් ගෙවා නැත. හිඟ නිවාස කුලී මුදල් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස වරින් වර සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කර ඇති නමුත් හිඟ කුලී මුදල් මේ වන තෙක් ගෙවා නැත. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම |
|---|---|---|
| තැන්පත් ගිණුම්වල වෙනස්වීම රු.11,710,791 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් වශයෙන් මුදල් ප්‍රවාහයේ දැක්විය යුතු වුවත් එය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේදී තැන්පත් ගිණුම්වල හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම්වල වටිනාකම මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ සඳහන් කල යුතු බව සඳහන් කර ඇත. |

### 1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය හැර ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයකරගත යුතු රු.863,127 ක් වූ ණය ශේෂයෙන්, වර්ෂ 05ක් ඉක්මවූ ශේෂය රු.342,336 ක් විය. | අයකරගත යුතු ණය ශේෂයන් කාලීනව අයකරගත යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වේ. |

**1.6.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීතිරීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| **(I) XIX පරිච්ඡේදයේ 4.1 වගන්තිය** | පොදු නිවාස, උපලේඛනගත නිවාස වෙන්කරදීම සම්බන්ධයෙන් වූ විධිවිධානවලින් බැහැරව හා දීර්ඝ පොරොත්තු ලේඛනයක් පැවතියදීත් සමුළු නිවාස 02 ක් පිළිවෙලින් රු.275 ක් සහ රු.1000 ක මාසික කුලියකට ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයට ලබා දී තිබුණි. | එක් නිවසක් සම්බන්ධ අමාත්‍ය මණ්ඩල තීරණය වර්ෂ 27 ක් පැරණි වීම හා අනෙක් නිවස එවැනි තීරණය රහිත බැවින් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | අමප/1991/116(70) දරන 1991 ඔක්තෝබර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක් නිවසකින් රු.275 ක නාමික කුලියක් හා එම අමාත්‍ය මණ්ඩල තීරණයම සැලකිල්ලට ගනිමින්, එවකට සිටි අමාත්‍යාංශ ලේකම් විසින් අනෙක් නිවස 2001 පෙබරවාරි 02 දින සිට රු.1000 ක නාමික කුලියක් අයකිරීමට තීරණය කර ඇත. |
| **(II) XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය** | තනතුරකට වෙන්කරන ලද නිවසක් හැර අනෙකුත් සියළුම නිවාසවල බදු කාලය වර්ෂ 5 කට සීමා වුවද, 2004 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා නිලධාරියෙකු නිවාසයක පදිංචි වී සිටියි . | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙකු වෙත 2004 වර්ෂයේ සිට වසර 05 ක කාලයක් සඳහා වෙන්කරදී ඇතත් නිවස ආපසු භාරදීමට කටයුතු කර නොමැති බැවින් මේ පිළිබඳව නීතිපති වෙතින් විමසීම කර ඇත. |

| | | | |
|---|---|---|---|
| **(ආ)2018 ජනවාරි 24 දිනැති අංක 02 / 2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | අමාත්‍යාංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශය සඳහා වන මානව සම්පත් සංවර්ධන සැලැස්මේ කෙටුම්පත සකස් කර ඇති අතර, කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව දන්ව මි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **ආදායම් කළමනාකරණය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------ | ------------- | ----------------------------------- |
| **(අ)** සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 950 ක් වූ අතර තථ්‍ය ආදායම රු. මිලියන 963.8 ක් වූයෙන් මූලික ඇස්තමේන්තුව ඉක්මවා ශුද්ධ ආදායම් රැස් කිරීම රු.මිලියන 13.8 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 128(2) හා 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව නිවැරදි ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් පරිපාලන කාර්යක්ෂම කිරීම හා අදාල වන පරිදි සංශෝධනයක් කළ යුතු වීම. | සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව හා තථ්‍ය ආදායම අතර වෙනස සියයට 1.3 පමණක් වන අතර රාජ්‍ය සේවක වැටුප් වැඩි වීම හා අළුතින් ඉදිකළ ගොඩනැගිලි වලින් අයවන කුලී වාර්තා වීම මත මෙලෙස ශුද්ධ ආදායම හා ඇස්තමේන්තුගත ආදායම අතර වෙනසක් පෙන්නුම් කිරීමට හේතු විය. |
| **(ආ)** පසුගිය වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ තථ්‍ය ගොඩනැගිලි කුලී ආදායම රු. මිලියන 51.2 කින් වර්ධනය වී තිබුණද ආයතන 42 කට අදාළ රු. මිලියන 258.9 ක ආදායම් අඩු වීමක් නිරීක්ෂණය විය. එම අඩුවීම් ප්‍රමාණය සියයට 0.86 ක සිට සියයට 96.82 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. | ආදායමේ විචලනයන් හඳුනාගෙන සුදුසු පියවර ගත යුතු වීම. | විවිධ හේතු මත ආදායමේ අසාමාන්‍ය අඩුවීම් හා වැඩිවීම පෙන්නුම් කිරීම, නිවාඩු නිකේතන වෙන්කිරීම් පසුගිය වර්ෂයට සාපේක්ෂව අඩුවීම යනාදී කරුණු හේතුවෙන් ආදායමේ අඩුවීමක් පෙන්නුම් කෙරේ. |

**(ඇ)** **හිඟහිටි ආදායම**

-----------------

| | | | |
|---|---|---|---|
| **(i)** | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ආදායම රු. මිලියන 188.5 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ආදායම රු.මිලියන 214.3 ක් විය. ඒ අනුව හිඟ ආදායම රු. මිලියන 25.9 කින් වැඩි වී තිබුණි. තවද, මෙම හිඟහිටි ආදායමෙන් රු. මිලියන 125.6 ක් 2015 දෙසැම්බර් 31 දිනට පෙර පැවති ශේෂය වූ අතර, එය මුළු හිඟහිටි ආදායමෙන් සියයට 59 ක ප්‍රතිශතයක් විය. | හිඟ ආදායම් යාවත්කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2018 වර්ෂයේ හිඟ කුලී රු. මිලියන 25 කින් වැඩිවී තිබුණු අතර ආයතන තුනකින් රු. මිලියන 15.6 ක් අය කර ගෙන ඇති අතර, ඉතිරි හිඟ කුලී අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| **(ii)** | සමාලෝචිත වර්ෂයේ අවසානයට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ හිඟ කුලිය පිළිවෙලින් රු. මිලියන 84.8 ක් හා රු. මිලියන 59.2 ක් විය. අමාත්‍යාංශයේ ලැබිය යුතු කුලිය තුළ ඇතුළත් 2013 වර්ෂයට පෙර සිට ලැබිය යුතු රු. මිලියන 44.8 ක් විය. | ආයතන දැනුවත් කර ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී සතොස ආයතනය වෙත ලබා දී ඇති ගබඩා වෙනුවෙන් අයවීමට නියමිත හිඟ කුලී පවතින බැවින් 2018 වර්ෂයේ වැඩි හිඟ කුලී ප්‍රමාණයක් පෙන්නුම් කිරිමට හේතු වී ඇත. |
| | මෙම හිඟ මුදලින් රු. මිලියන 36 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අය විය යුතුව තිබූ අතර, 2016 වර්ෂයේදී ගොඩනැගිල්ල භාවිතය අත්හැර තිබුණ ද හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් ගතව ඇති ශේෂ අයකර ගැනීමට පියවර ගත යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි |
| **(iii)** | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි රාජ්‍ය ආයතන 05 ක් වෙත කුලී පදනම මත ලබා දීමෙන් 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අයකර ගත නොහැකිව ඇති කුලිය රු. මිලියන 36.6 ක් විය. | ආයතන දැනුවත් කර ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | එම රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 43.3 ක ප්‍රතිපාදනය කිසිදු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වේ. අමාත්‍යාංශ සංශෝධනය වීම හා නිවාඩු නිකේතන 07 ක් සඳහා අපේක්ෂිත වියදම් සිදු නොවීම හේතුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදන ඉතිරිව ඇත. |
| **(ආ)** වැය විෂයන් **22** ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 876.3 ක් වූ අතර, උපයෝජනය රු. මිලියන 672.5 ක් විය. අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා වැය විෂයයන්ට අදාළ ඉතිරිවීම සියයට 16 ක සිට සියයට 67 ක් දක්වා අතර පරාසයක් ගෙන තිබුණි. | හැකිතාක් නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වේ. වැය විෂයයන් 12 කට භාණ්ඩාගාරයෙන් අවශ්‍ය අක්මුදල් නොලැබීම මත සහ අනෙකුත් වැය විෂයයන් 10 සඳහා විවිධ හේතු මත ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී ඇත. |
| **(ඇ)** මුදල් රෙගුලාසි 66 යටතේ අවස්ථා 6 කදී ප්‍රතිපාදන මාරු කරගෙන තිබූ අතර, එම ප්‍රතිපාදනයන් සියයට 52 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. අවස්ථා 02 කදී පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන් කරගත් ප්‍රතිපාදනය සියයට 100 ක්ම උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වේ. අවස්ථා 06 කදී පවරාගත් ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරිව ඇත. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවස්ථා 13 කදී මුදල් රෙගුලාසි 216 (අ) විධිවිධානවලට පටහැනිව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු.1,513,630 ක බැරකම් සඳහා එකඟ වී තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණයන් හා එකඟ වන අතර ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 10 ක් ඇතුලත පියවිය යුතුව තිබුණද, අවස්ථා 7 කදී නිකුත් කර තිබු තත්කාර්යය අතුරු අග්‍රිම දින 07 ක සිට දින 22 ක් දක්වා පරාසයක කාල ප්‍රමාදයකින් යුතුව පියවා තිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කාර්යය නිමවී දින 10 ක් ඇතුලත අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රමාදයක් සිදුවී ඇති බවත් ඉදිරියේදී එවැනි ප්‍රමාදයන් සිදුවීම් වලක්වා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(අ)** ඒකාබද්ධ සේවා අංශය විසින් සැලැසුම් කර තිබුණු බඳවා ගැනීම් 07 ක් සහ විභාග 16 ක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි | බඳවා ගැනීම් විභාග නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කළ යුතු වීම. | 2018 වසර සඳහා විභාග වැඩසටහන සකස් කිරීමේ දී ඇතුළත් කළ යුතු විභාග සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් දැනුවත් කිරීමට කටයුතු කරන ලද අතර, විභාග නිසිකලට පැවැත්වීමට නොහැකි වීම හේතුවෙන් මුහුණ දී ඇති දුෂ්කරතාවය විභාග කොමසාරිස් ජනරාල්ගේ අවධානය සඳහා යොමු කර ඇත. |
| **(ආ)** සමාලෝචිත වර්ෂය මුල පැවති රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු 6,193 ක් සඳහා බඳවා ගැනීම් කිරීමට ගැසට් කර තිබුණද, නිලධාරීන් 5,427 ක් පමණක් බඳවා ගැනීම හේතුවෙන් තවදුරටත් පුරප්පාඩු 766 ක් පැවතිණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට පුස්තකාල සේවයේ තනතුරු 135 ක් පුරප්පාඩුව තිබුණි. | අදාළ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පිරවීමට හැකිව තිබූ පුරප්පාඩු 5,432 න් 5,427 ක් වට දෙකක් මගින් පිරවීමට කටයුතු කර ඇත. ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයට සීමිත පදනමින් තවත් පුරප්පාඩු 12 ක් පිරවීම සඳහා විභාග දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිඵල ලේඛන ගෙන්වා ගෙන ඇත. |
| **(ඇ)** ශ්‍රී ලංකා පරිපාලන සේවයේ **III,II,I** සහ විශේෂ ශ්‍රේණිවල නිලධාරීන් 110 ක් මාරුවීම් ලබා නොදී වසර 5 කට වඩා කාලයක එකම ස්ථානයේ සේවයේ නියුක්ත කර තිබුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටි සංග්‍රහයේ 195 (vi), (vii) සහ 203 (v) අනුව කටයුතු කළ යුතු වීම. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III, II, I සහ විශේෂ ශ්‍රේණිවල නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා දුන්නද සේවා අවශ්‍යතාවය මත අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරිම මගින් එම කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන තවදුරටත් එම සේවා ස්ථානයේම සේවය කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (ඇ)ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ **III,II,I** සහ විශේෂ ශ්‍රේණිවල නිලධාරීන් 482 ක් මාරුවීම් ලබා නොදී වසර 5 කට වඩා කාලයක් එකම ස්ථානයේ සේවයේ නියුක්ත කර තිබුණි. ඉන් නිලධාරීන් 30 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබා දී නැවත අවලංගු කර තිබුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටි සංග්‍රහයේ 195 (vi), (vii) සහ 203 (v) අනුව කටයුතු කළ යුතු වීම. | 2018 ජූනි 30 දිනට පුරප්පාඩු 473 ක් පැවතීම නිසා නිලධාරීන් විශාල සංඛ්‍යාවක් නිත්‍ය සේවා ස්ථානයට අමතරව වැඩ බැලීම් රාජකාරී ඉටුකිරීම් සඳහා පත්කර තිබීම හේතුවෙන් වසර 05ක් සම්පූර්ණ කළ සියළු නිලධාරීන් ස්ථානමාරු කිරීම ගැටළු සහගත විය.<br>එසේම අදාල ආයතන ප්‍රධානීන් හා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ නිර්දේශ සළකා ස්ථානමාරු ලබාදුන් 30 කට ආසන්න සංඛ්‍යාවකගේ වාර්ෂික ස්ථානමාරු අවලංගු කිරීමට කටයුතු කර ඇත. |
| **(ඉ)** ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III පංතියේ නිලධාරීන් 148 කට හා II පංතියේ නිලධාරීන් 148 කට උසස්වීම් ලබා දීමට සැලසුම් සකස් කර තිබූ නමුත්, නිලධාරීන් 14 දෙනෙකුට පමණක් උසස්වීම් ලබාදී තිබුණි. | සැලැසුම් කළ පරිදි කටයුතු කළ යුතු වීම. | සුදුසුකම් සපුරාගත් නිලධාරීන් පමණක් උසස් කිරීම සිදු කරනු ලැබේ. |
| **(ඊ)** ශ්‍රී ලංකා සැලැසුම් සේවයේ නව නිලධාරීන් 133 ක් බඳවාගැනීම, 2015 කණ්ඩායම සේවයේ ස්ථිර කිරීම හා 2008 කණ්ඩායම II පංතියට උසස් කිරීම යන කාර්යයන් ඉටුවී නොතිබුණි. | -එම- | නවක නිලධාරීන් බඳවා ගැනීම සඳහා වූ විභාග ප්‍රතිඵල 2018 වර්ෂය තුළ නිකුත් නොකිරීම හේතුවෙන් අපේක්ෂිත පරිදි නවක නිලධාරීන් බඳවා ගැනීමේ කටයුතු අවසන් කිරීමට නොහැකි විය. III ශ්‍රේණියට බඳවා ගනු ලැබූ නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම සඳහා නිවැරදිව යොමු කරන ලද ලිපි ලේඛන පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අදාළ වර්ෂය තුළම යොමු කිරීමට සිදු කරන ලදී. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| <u>නිල පියස ව්‍යාපෘති -</u> | | |
| **(i)**මොණරාගල ව්‍යාපෘතියේ 2018 වර්ෂය අවසානයේදී සියයට 60.8 ක් භෞතික ප්‍රගතියක් සැලැසුම් කර තිබුණුද ලඟාකරගත් ප්‍රගතිය සියයට 44 ක් විය. | වෙන් කළ ප්‍රතිපාදන අනුව ඉලක්ක කළ පරිදි කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘතිය ආරම්භක අවධියේ ඇතිවූ අයහපත් දේශගුණික තත්ත්වයන් නිසා මෙම ව්‍යාපෘතිය සැලකිය යුතු කාලයක් ඉදිකිරීම් සිදුකර ගැනීමට නොහැකි තත්ත්වයක පැවතුණි. |
| **(ii)**ගම්පහ ව්‍යාපෘතියේ 2018 වර්ෂය අවසානයේදී සියයට 65 ක් සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණු අතර ඉන් සියයට 42.25 ක් පමණක් ලගා කරගෙන තිබුණි. | -එම- | ව්‍යාපෘතිය ආරම්භයේදී මායිම් ආරවුලක් හා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය හා කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර ගැටළු රැසක ප්‍රතිඵලයක් ලෙස මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම සැලැකිය යුතු මට්ටමකට අඩාල විය. ලේකම්තුමා සමඟ පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී දැනුවත් කිරීම් සිදුකල අතර, ඒ අනුව මේවන විට එහි Phase I හි භෞතික ප්‍රගතිය සියයට 90 ක්ව පවතී. |
| **(iii)**මහනුවර ව්‍යාපෘතියේ 2018 වර්ෂයේදී සැලැසුම් කළ කොන්ත්‍රාත් කාර්යයන්ගෙන් සියයට 15 ක් පමණක් සම්පූර්ණ කර තිබු අතර ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදනය වූ රු. මිලියන 25 සම්පූර්ණයෙන්ම උපයෝජනය කර තිබුණි. | එම | යෝජිත භූමියේ පිහිටි පැරණි ගොඩනැගිලි කඩා ඉවත් කිරීමටත්, අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහාත් ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක සැලැස්ම වෙනස් කිරීමට කටයුතු කිරීමටත් කාලය ගතවූ බැවින් ඉදිකිරීම් ආරම්භ කිරීමද ප්‍රමාද විය. කොන්ත්‍රාත්කරුගේ කාර්යය සාධනය මේවන විටත් ප්‍රශස්ත මට්ටමක නොපවතින බැවින් කොන්ත්‍රාත්කරු හා උපදේශන සේවා සපයනු ලබන ආයතනයට ඒ පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් උපදෙස් ලබාදී ඇත. |
| **(iv)** පොලොන්නරුව ව්‍යාපෘතියේ 2018 වර්ෂය අවසානයේදී සම්පූර්ණයෙන් නිම කිරීමට සැලැසුම් සකස් කර තිබුණු අතර, ඉන් සියයට 09 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. එමෙන්ම 2018 වර්ෂයේදී සැලසුම් කළ කොන්ත්‍රාත් කාර්යයන්ගෙන් සියයට 05 ක් | එම | • යෝජිත භූමියේ පිහිටි ඉදිකිරීම් කඩා ඉවත් කිරීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා ද මාස 6ක කාලයක් ගතවිය.<br>• ප්‍රමාණවත් මට්ටමේ ගුණාත්මක භෞතික ප්‍රගතියක් පෙන්වීමට |

| | | |
|---|---|---|
| පමණක් සම්පූර්ණ කිරීම සඳහා වෙන් කළ රු. මිලියන 67.7 ක මුදල සම්පූර්ණයෙන්ම උපයෝජනය කර තිබුණි. | | අපොහොසත් වූ බැවින් අදාළ කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම 2019.03.21 දින අත්හිටුවීම සඳහා **(Termination of Contractor)** කටයුතු කරන ලදි. ඒ අනුව උපදේශන ආයතනයේ උපදෙස් පරිදි නව කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී |

**3.3 පාඩු හා හානි**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(අ)** සමාලෝචිත වර්ෂය අවසානයට පොතෙන් කපා නොහල අලාභ වටිනාකම රු. මිලියන 2.1 ක් වූ අතර තව දුරටත් කටයුතු කළයුතු ශේෂය රු. මිලියන 1.5 ක් විය. | මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව පොතෙන් කපා හැරීම් හා අයකරගැනීම පිළිබඳ අප්‍රමාදව කටයුතු කළ යුතු වීම. | පාඩු හා හානි කපාහැරීම් හා අයකරගැනීම් මුළු ශේෂය වන රු.1,267,643 පිළිබඳ අයකරගැනීමට කටයුතු කරමින් පවතියි. වාහන අනතුරුවලට අදාල ලිපිගොනුවල කටයුතු හැකි ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(ආ)** 23 **A** සමුළු නිවාසය ගිනි ගැනීමට ලක්වී දැඩි අලාභ හානි සිදුව තිබුණ ද අලාභ හානි ගණනය කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 103 (1) හා 104 (1) ප්‍රකාරව අලාභ හානි පිළිබඳව කටයුතු කළ යුතු වීම. | 2018.06.04 දින ඇති වූ හදිසි ගින්නෙන් සිදුවූ අලාභය පිළිබඳව, තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරී විසින් ගණනය කරන ලද හානිය පිළිබඳ වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදුකර ඇති බව දන්වමි. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ----------------------- | ------------- | -------------------------------------- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව අමාත්‍යංශය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------- | ------------- | -------------------------------------- |
| 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1670ක් වූ අතර ඉන් 360ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |